14

# තැනට සුදුසු නුවණ

*(තිරය විවෘත වෙයි. කැලයෙහි ගස්, මල් ඇති බව හඟවන සංකේත ඇත. වේදිකාව මැද ලී කොටයකි. කැලේ සත්තු විවිධ ඉරියව්වලින් සිටිති. පසුබිමින් කුරුල්ලන්ගේ නාදය ඇසෙයි.)*

*(පොතේ ගුරු වේදිකාවේ කෙළවරට පැමිණ මෙසේ පවසයි.)*

**පොතේ ගුරු:** රූස්ස ගස්
ඇති විශාල
වනයක
වෙසෙන සත්තු,
නරියකුගේ
පෙලඹවීමෙන්
තමන්ට
අනාගතයේ දී
සිදුවීමට ඉඩ
ඇති මහා
භයානක
ආපදවකින්
ගැලවීම සඳහා
සාකච්ඡා
කිරීමට මෙසේ
රැස් වූහ.



*(නරියා වේදිකාවට පැමිණෙයි.)*

**නරියා:** *(තමාට ම)* හැම ද ම කෑම සොය සොයා මහන්සි වෙලා මට තිත්ත වෙලා..... දැන් ඉතින් මගේ මොළේ පාවිච්චි කරලා කුමක් හෝ උපක්‍රමයක් යොදලා කැලේ සතුන් රවටා ගන්න ඕනෑ. එතකොට හොඳට බඩ කට පුරා කන්න පුළුවනි.

*(ශබ්ද නඟා)*

තමුන්නාන්සේලා මෙතැනට පැමිණීම ගැන ඉතා ම ස්තුතියි.

**වලහා:** මොකද නරිහාමි, කලබලයක් වත් ද? ඇයි, අපට පැමිණෙන්න කීවෙ?

**නරියා:** මම මේ හැම දෙනා ම මෙතැනට රැස් කළේ කලබලයක් සිදු වීමට කලින්. අප විනාශ කරන්න සතුරන් ඇවිත්. ඈත කැලෑවලිනුත් තවත් සතුරන් එනවලු.! අප සියලු දෙනා ම විනාශ වීමට ඉඩ තිබෙනවා. අපි හැමෝ ම එකතු වෙලා කිසි යම් පියවරක් ගත යුතු නිසයි මම පණිවුඩ යැව්වේ.....

**සත්තු හැමෝම:** *(එකිනෙකාගේ මුහුණු බලමින්)* මහා විනාශයක් නෙ වෙන්න යන්නෙ.... දැන් අපි මොකද කරන්නෙ?

**නරියා:** අපි රජෙක් පත් කර ගනිමු.

**අලියා:** අදහස නම් පංකාදුයි..... රජකමට නම් ලොකු ඇඟපතක් තිබෙන්න එපායැ! .....

**කොටියා:** පුහ්! ... ඇඟපත නම් තිබෙනවා....... මොළයක් තිබෙනවා ද මෙයාට?

**ගෝණා:** අපි පත් කර ගන්නා රජතුමා මස් මාංස කටේවත් තියන්නෙ නැති ධර්මිෂ්ඨ, උදාර කෙනෙක් වෙන්න ඕනෑ.

*(සත්තු සියලු දෙනා නටමින් ගායනා කරති.)*



රජෙක්.... අපට රජෙක්
තෝරා ගන්න රජෙක් //
කොයි කාටත් එක විධියට සලකන හොඳ රජෙක්
අපේ කැලේ රජ කරන්න
තෝරා ගනිමු රජෙක්

දුක් කරදරවලින් තොර ව
සතුටින් සමගියෙන් ඉන්න //
අපි සේරම එකමුතු වී
මනාපයට භේද නොවී //
අපි තෝරමු රජෙක්
අප රකින්න රජෙක්
රජෙක් අපට රජෙක්

බොරුවෙන් අප මුළා නොකර
ගුණ යහපත්කම් සුරකින //
තළා පෙළා අප නොමරන
දහැමින් අප බලා ගන්න
රජෙක් අපට රජෙක්

*(ගීතය අවසාන වන විට නරියා **වලස්හාමි** අමතයි)*

**නරියා:** මොකද, වලස්හාමි කටේ අගුල් වැටිලා වගේ බලා ඉන්නේ? තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්නකෝ.....

**වලහා:** මම මේ... ටිකක් කල්පනා කළා. අපි කැලෑවෙ රජතුමා ලෙස සිංහයා පත් කර ගනිමු. *(සමහර සත්තු දුවන්නට සැරසෙති.)*

**මුවා:** බුදු අම්මෝ.... අපි නැතෝ..... මගේ ඇඟේ මයිල් කෙළින් හිටියා..... සිංහ රාජයා ගැන මතක් කරන කොට....

**නරියා:** කොහෙ ද මේ හිස හැරුණු හැරුණු අතේ හැමෝ ම දුවන්න හදන්නෙ?

**ගිරවා:** දුවන්නෙ! ඇයි දන්නෙනැද් ද? සිංහ උන්නැහෙගෙ සැර...... සිංහයා කෑගසන සද්දෙට කන් අඩි පැළෙනව නෙ!.......

**ගෝණා:** ඔව්.... ඔව්.... කොයි තරම් ඇඟපත තිබුණත් අලියාත් බයයි සිංහයාට.

**නරියා:** බිය වෙන්න කරුණක් නැහැ....... මේ සිංහයා කිසිම සතකුට හිංසාවක් කරන අයෙක් නොවෙයි. ඒ ගැන ස්වල්පයක්වත් සැක හිතන්න එපා.

**සත්තු:** එසේ නම් අපි සිංහයා රජකමට පත් කර ගනිමු.

*(නරියා සිංහ රාජයා වේදිකාවට කැඳවාගෙන එයි.)*

**කොටියා:** සිංහ රාජයාට **ජයවේවා! ජයවේවා!**

**සියල්ලෝම:** අපගේ රජතුමාට **ජයවේවා!**

**පොතේ ගුරු:** නරියාගේ සහ සිංහයාගේ කපටි අදහස් නොදන්නා අසරණ සත්තු තමන්ගේ ආරක්ෂාවට රජකු ලැබීම නිමිති කොට ගෙන මහත් සේ ප්‍රීතියට පත් වූහ.

**සත්තු:** ලැබුණා අපහට රජෙක්
අප කාටත් හොඳ රජෙක් //
ගුණ නුවණින් පිරුණු කෙනෙක්
කරුණාවෙන් හරිත හදක්
ඔහුට තිබේ ලු
මස් මාංස කන්නෙ නැතේ
අල පලතුරු ඔහු බුදිතේ
පුදුම කෙනෙක් ලු .......
ලැබුණා අපහට රජෙක්
අප කාටත් හොඳ රජෙක්

**සිංහයා:** මට රජකම දීම ගැන සියලු දෙනාට ම ඉතා ම ස්තුතියි. මම සාධාරණ ව නුඹලා සියලු දෙනා ම ආරක්ෂා කරන්නෙමි. නුඹලාට යහපත සලසන්නෙමි....

*(නරියා සිංහයාට ළංවී රහසින් යමක් කියයි.)*

මේ වනයේ වාසය කරන සියලු සතුන් ආරක්ෂා කිරීම සඳහා ඇප කැප වී වැඩ කරන බවට මම පොරොන්දු වෙමි. මට තනියම රාජධානියේ කටයුතු කිරීමට අපහසුයි. එහෙයින් මගේ උදව්වටත් නුඹලාගේ යහපතටත් ඇමැතිවරු තිදෙනකු පත් කිරීමට අපේක්ෂා කරමි.

**නරියා:** එසේය, දේවයන් වහන්ස....... මේ මම.....

**සිංහයා:** නරිහාමි මට සමීප ව කටයුතු කරන, ගුරුහරුකම් දෙන කෙනෙකු හෙයින් මගේ උපදේශක තනතුරට පත් කරමි.

*(වලහා දෙස බලා)*

වලස්හාමි, කිසිවෙකුට පක්ෂ නොවී කටයුතු කරන

අයෙකු නිසා ඔබ මගේ පළමු වන අමාත්‍යවරයා ලෙස පත් කරමි.

*(වඳුරා දෙස බලා)*

හදිසි පණිවුඩ ඉක්මනින් එහා මෙහා ගෙන යාමටත් රාජධානියේ සිදු වන දේ බලා ගැනීමටත් හැකි අයෙකු නිසා වඳුරුහාමි මගේ දෙවන ඇමති ලෙස පත් කරමි.

*(හාවා දෙස බලා)*

ඉතා තීක්ෂණ බුද්ධියක් ඇති හාහාමි මගේ තුන්වන ඇමති ලෙස පත් කරමි.

*(වලහා, වඳුරා සහ හාවා, සිංහ රාජයා වෙත පැමිණ තමන්ගේ යටහත් බව ප්‍රකාශ කර සිටිති.)*



**සිංහයා:** අද රාජ සභාවේ වැඩ කටයුතු මෙතෙකින් සමාප්ත කරමි.

**සත්තු:** අපේ රජතුමාට ජයවේවා! ජයවේවා!

*(සිංහයා, නරියා සමග පිටත් වෙයි. ඇමතිවරු පිටුපසින් යති.)*

**පොතේ ගුරු:** මෙසේ කලක් ගත විය. රහසින් ඇත කැලයට ඇතුළු වන සිංහයා සහ නරියා සතුන් මරා කති. එහෙත් මස් මාංස අනුභව කිරීමෙන් වැළකී සිටින බව සතුන්ට හඟවති.

*(වලහා, වඳුරා සහ හාවා වේදිකාවට පැමිණෙති.)*

**වලහා:** රජතුමා යහන්ගත වෙලා වෙන්නැති...... නරිහාමිත් පේන්න නැහැ නෙ ....

**වඳුරා:** ඔව්.... ඔව්.. රජ වුණාට පස්සෙ රාජ තේජස වැඩි වෙලා, මීපැණි පලතුරු කාලා. මම ඊයෙත් මී පැණි ගෙනැවිත් දුන්නා.

**හාවා:** රජතුමා සිල්වත් නිසා දැන් සත්තු බියක් සැකක් නැතුව ඉන්නවා කැලේ.

**වලහා:** කට .... කට ..... මම දැක්කා දැන් කීප දවසක් ම...

**හාවා:** නිරාහාර ව සැතපෙනවා!...........

**වලහා:** මොන බොරු ද? එහා කැලේ සතුන් මරලා කාලා එනවා. සුන් බුන් ඉවර කරන්නෙ නරිරාල....

**හාවා:** අනේ අනිච්චං..... මෙහෙමත් කපටිකමක්....

**වඳුරා:** ඔන්න..... ඔන්න..... සිංහ රාජයාණන් වහන්සේ වඩින සේක.....

*(සිංහයා වේදිකාවට පැමිණෙයි. නරියා පසුපසින් එයි)*

**සිංහයා:** *(පසෙකට හැරී තමාට ම)*

රජ වෙන එකත් මහා පාපයක්..... හිතේ හැටියට ආහාරපාන ගැනීමට ඉඩක් නැහැ. ඒක කරන්නත් වෙන්නේ රහසින්..... ඇමැතිවරු ඇහැ ගහගෙන ඉන්නවා...... උන්ගෙන් කිසි ම වැඩක් නැහැ. එළවලා දමන්න ඕනැ..... කොහොම ද එසේ කරන්නෙ? වැරැද්දක් සොයා ගත යුතුයි.

*(කල්පනා කරයි)* වැරැද්දක්! ..... හරි..... මට අපූරු අදහසක් හිතට ආවා.

*(වේදිකාව මැදට පැමිණ කොටය උඩ හිඳ ගනියි.)*

**වලහා, වඳුරා, හාවා:** *(තිදෙනා ම)*

දීර්ඝායුෂ ලැබේවා දේවයන් වහන්ස!......

**සිංහයා:** මොකද නරිහාමි, ඈතට වෙලා බයෙන් වගේ?.....

**නරියා:** නැහැ, දේවයන් වහන්ස... මගේ අදහසක් තිබෙනවා ඔබ වහන්සේගෙ අවසරය ඇතිව ගෙවල් පැත්තෙ යන්න.....



**සිංහයා:** හොඳමයි... අද අපට වැදගත් සාකච්ඡාවක් තිබෙනවා. මට රජකම් කිරීමට නුඹලා තුන් දෙනා බොහෝ ම උදවු කළා. ඒ ගැන මම ඉතාමත් ස්තුතිවන්ත වෙනවා.

මට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එයට තවමත් පිළිතුරක් ලබා ගත නොහැකි වුණා.

**වලහා:** ප්‍රශ්නය ඉදිරිපත් කරනු මැනවි, දේවයන් වහන්ස. අපට පිළිතුරු දීමට පුළුවනි.

**සිංහයා:** *(වලහා අමතා)* නුඹ මගේ පළමුවන ඇමැතිවරයා.

මට දැන ගන්න ඕනෑ.... මම කට ඇරියා ම කුමන සුවඳක් ද පිට වෙන්නේ කියලා...

*(සිංහයා කට ඇරගෙන හිඳියි. වලහා කල්පනා කරයි.)*

**වලහා:** *(තමාට ම)* පුදුම ප්‍රශ්නයක් නෙ ! මස් බුදින මෙයාගෙ කටින් පිට වෙන්නෙ කුණු ගඳ මිස මොන සුවඳක් ද?

*(ශබ්ද නඟා)*

දේවයන් වහන්ස.... උග්‍ර කුණු ගඳක් පිට වෙනවා.

**සිංහයා:** *(වලහා වෙතට පනියි)*

*(කෝපයෙන්)* මො.....න.......වා.....! තොට කොයින් ද එච්චර හයියක්. මගෙ කට ගඳයි කියන්න? උඹ තරමට වැඩියි.

*(සිංහයා, වලහා මරා දමයි)*

*(සිංහයා, වඳුරා දෙස බලා)* උඹ මගේ දෙවන ඇමතිවරයා නෙ..... උඹ උඩින් බිමින් දෙකෙන් ම යන නිසා විවිධාකාර ගඳ සුවඳවල් දන්නවා ඇති නෙ ! උඹ කියපන්...... මගේ කටින් පිට වෙන්නෙ කුමන සුවඳක් ද?

*(වඳුරා බියෙන් බලා සිටියි. සභාවට ඇසෙන සේ මෙසේ කියයි.)*
මෙහෙමත් අපරාධයක්. ඇත්ත කියලා වලස්හාමි මැරුම් කෑවා. මෙයා මස් කකා අපට පෙන්වනවා සිල් රකින බවක්. දැන් ඉතින් මටත් මරණය තමයි. ඒ නිසා බොරුවක් ම කියන්න ඕනැ.

**වඳුරා:** *(ශබ්ද නඟා)* දේවයන් වහන්ස... ඔබ වහන්සේ ඉතා සිල්වත් නිසා දැන් ඔබ වහන්සේගේ ශ්‍රී මුඛයෙන් නිකුත් වෙන්නේ පිච්ච මල් සුවඳක්.

**සිංහයා:** අනේ! වඳුරෝ ! ..... තෝ හිතුව ද මාව මෝඩයෙක් කරන්න!..... තෝ දන්නෙ ම බොරු පුරසාරම් දෙඩවන්න ම තමයි. තොගෙ ඇමතිකමෙන් මට වැඩක් නැහැ.

*(සිංහයා කෝපයෙන් වඳුරා මරා දමයි.)*

*(හාවා බියෙන් එහා මෙහා යයි)*

**සිංහයා:** හා හාමි .... මෙහාට ළං වෙයන්.... අර දෙන්න ම මාව රැවටීමට ගොස් මැරුම් කෑවා. උඹ හොඳට හිතලා උත්තර දෙන්න ඕනැ..... තේරුණා ද?

*(හාවා බියෙන් ගැහෙමින් වේදිකාවේ කොනකට අවුත් දෙවියන් යදියි.)*

අනේ..... දෙවියනි..... ඔබ වහන්සේවත් මේ අවනඩුව බලන සේක් වා! මස් බුදින නිසා සිංහ රාජයාගේ කට කුණු ගඳයි.... මතක් වෙන කොට මගේ බඩ දහලනවා..... ඒත්..... කියන්නෙ කොහොම ද? ඇත්ත කියලා වලස්හාමි අපරාදෙ මැරුම් කෑවා. වඳුරු හාමි වැරැදි වෙලාවට නෙ බොරු කීවේ!...... නිරපරාදෙ මැරුම් කෑවා. මේ නම් අපි තුන් දෙනා මරන්නට ඇටවූ උගුලක්.... බොරු කියලත් බැහැ.....

**සිංහයා:** හා හාමි .... මෙහෙ වරෙන්.... මෙහෙ වරෙන්. මොකද උඹ වෙව්ලන්නෙ? .... කල් වේලා ගත නොකොට වහා උත්තර දෙනු.

*(සිංහයා පුදුම වී බලයි. හාවා කිවිසුම් අරියි.)*

**හාවා:** දේවයන් වහන්ස..... මම කීප වතාවක් ඔබතුමාගෙ ශ්‍රී මුඛයට ළං වී බැලුවා. මට කිසි ම ගඳක් සුවඳක් එන්නෙ නැහැ නෙ.....

*(සිංහයා පුදුම වී බලයි. හාවා කිවිසුම අරියි.)*

**සිංහයා:** ඇ බොල මොකක් ද ඒ කියන්නෙ?

**හාවා:** *(නැවතත් කිවිසුම් අරියි.)* දේවයන් වහන්ස, මට හොඳට ම සෙම්ප්‍රතිශ්‍යාව. ඔබ වහන්සේ අවසර දෙන්නේ නම් තව දවස් දෙක තුනකට පසු ව ඇවිත් කියන්නම්.

**සිංහයා:** තව දවස් තුනකින් අවුත් ප්‍රශ්නයට පිළිතුරු දිය යුතුයි. පලයන්..... පලයන්.....

*(සිංහයා පිට ව යයි.)*

*(හාවා ජයග්‍රාහී විලාසයෙන් එනු දක සත්තු වහා පැමිණ හාවාගෙන් ප්‍රශ්න කරති.)*

**හාවා:** *(ප්‍රීතියෙන් උඩ පනිමින්)*

අප්පේ... ඉතා ම අමාරුවෙන් නෙ බේරුණේ.... අම්මෝ... මගේ පණ.....

**අලියා:** ඇයි? ඇයි? මොකද හා හාමි සිදු වුණේ?

**පොතේ ගුරු:** සිදු වූ සියලු දේ විස්තර කළ හාවා තමාගේ ව්‍යාජ සොම්ප්‍රතිශ්‍යාව නිසා ජීවිතය ගලවා ගත් බවත් තීක්ෂණ බුද්ධිය මෙහෙයවා ගැටලුව විසඳ ගැනීමට හැකි වූ බවත් සතුන්ට පැහැදිලි කර දුන්නේ ය.

**මුවා:** හා හාමි අනූනවයෙන් නෙ බේරිලා තියෙන්නෙ!

**හාවා:** මම නම් බේරුණා.... දන් **දුටු තැන අල්ලනු** තමා.

**සත්තු:** අපොයි! දෙවියනි! .... කාට කියන්න ද මේ අවනඩුව...

*(සත්තු ගායනා කරමින් නටති.)*



නුවණ ඇති හින්ද
නුවණ ඇති හින්ද – ආවෙ බේරිලා
පුංචි හා පැංචා අපේ සුරතලා //
නපුරු ගති ඇත්තන්
හඳුනා ගන්න හොඳින් //

ඒ අයගෙන් මිදී
අපිත් දබර නොවී //
නටමු නටමු ගීත ගයමු
අපි සතුටින් බැඳී //
*(තිරය වැසෙයි)*

***අනුලා සේනාරත්න***

## පැහැදිලි කිරීම්

**තීක්ෂණ බුද්ධිය** – තියුණු නුවණ
**ව්‍යාජ** – මවා පෑ
**සමාප්ත කරමි** – අවසන් කරමි
**අපේක්ෂා කරමි** – බලාපොරොත්තු වෙමි
**උපදේශක** – උපදෙස් දෙන තැනැත්තා
**ධර්මිෂ්ඨ** – දැහැමි

## අවබෝධය

1. අවස්ථාවට උචිත පරිදි හඬ හසුරුවමින් මෙම නාට්‍යය කියවන්න.

2. i. වනයේ සිටි සතුන් එක තැනකට රැස් කිරීමට මූලික වූයේ කවුරුන් ද?

   ii. එසේ කිරීමට හේතු වූ සැබෑ කරුණ කුමක් ද?

3. සතුන්ගේ යෝජනා අනුව කැලේ රජා ලෙස පත් වූයේ කවුරුද?

4. පළමු වන ගීතයේ සඳහන් වන පරිදි සතුන් රජතුමාගෙන් බලාපොරොත්තු වූ ගතිගුණ මොනවා ද?

5. රජතුමා ඇමැතිවරුන් තිදෙනකු පත් කර ගත්තේ ය. ඒ කවුරුද? එසේ ඇමැති පදවි දුන්නේ ඔවුන්ගේ කුමන දක්‍ෂතා සලකා ගෙන ද?

6. i. කලක් ගත වන විට සිංහ රාජයාට ඇමතිවරුන් අප්‍රිය විය. ඊට හේතු මොනවා ද?

   ii. ඔවුන් තනතුරුවලින් ඉවත් කිරීමට සිංහයා යෙදූ උපාය කුමක් ද?

7. වලහා සහ වඳුරා මරනු ලැබුවේ ඇයි?

8. හාවා බේරුණේ කෙසේ දැයි විස්තර කරන්න.

## භාෂා ක්‍රියාකාරකම්

9. මෙම යෙදුම් පැහැදිලි කරන්න.
   i. තිත්ත වෙලා
   ii. කටේ අගුල් වැටිලා
   iii. ඇගේ මයිල් කෙළින් හිටියා
   iv. ඇහැ ගහ ගෙන ඉන්නවා
   v. අනූනවයෙන් බේරුණා

10. ඇතැම් වචනවලින් හැඟවෙන අදහස ම ගෙන දෙන වෙනත් වචන ඇත.

    උදා: **කියනවා** – ප්‍රකාශ කරනවා, දොඩනවා

    පහත දැක්වෙන ක්‍රියා පද සඳහා යෙදෙන වෙනත් වචන වරහන් තුළින් තෝරා ලියන්න.

**එනවා** :

**කනවා** :

(පැමිණෙනවා, අනුභව කරනවා, වඩිනවා, සම්ප්‍රාප්ත වෙනවා, වළඳනවා, බුදිනවා, භුක්ති විඳිනවා, ගිලිනවා)

11. මෙම පාඩමේ

    i. **විස්මයාදි ලකුණ** ii. **තිත් පෙළ**

    යන විරාම ලකුණු යෙදී ඇති තැන් තුන බැගින් උපුටා ලියන්න.

12. වර්තමාන කාල (අනතීත) ක්‍රියා පද යොදා හිස් තැන් පුරවන්න.

    i. මම සියලු සතුන්ට ආරක්ෂාව ......................
    ii. අපි සිංහයා රජකමට පත් ......................
    iii. නුඹලා මට උදවු ......................
    iv. ඔහු කැලයට ගොස් පලතුරු ......................
    v. ඔවුහු පැටවුන්ට ද ආහාර ......................

## පැවරුම්

1. අදාළ චරිතවලට ගැළපෙන ඇඳුමින් සැරසී නාට්‍යය රඟ දක්වන්න.
2. '**ඇගේ මයිල් කෙළින් හිටියා**' වැනි ඉඟි වැකි 10 ක් ලියන්න. එක් එක් ඉඟි වැකිය ඉදිරියෙන් ඉන් හැඟැවෙන අදහස ලියන්න.
3. මෙම නාට්‍යය ඔබේ පාසලේ වේදිකා ගත කිරීමට කටයුතු සූදානම් කර ඇතැයි සිතන්න. දින දෙකක් ප. ව. 3.00 ට පාසල් සිසුන් සඳහා දර්ශන පැවැත්වීමට තීරණය කර තිබේ. දිනය, වේලාව සඳහන් කරමින් අවට පාසල්වලට යැවීම සඳහා දැන්වීමක් සකස් කරන්න.